

# වීඩියෝකරණයෙන් නම රැන්දූ විජිත කුමාර

මෙල්බන් ශ්‍රී ලාංකික සමාජයේ බොහෝ උත්සව වලදී අපි ඔහු දකිමු. ඔහුගේ කමරාවෙන් ලැබෙන සල රූ සහ නිසල සේයා රූ අපට ඉතා පුරුදුය. අපේ සමාජයේ වැදගත් අවස්ථා වෙහෙස නොබලා සිය කැමරාවේ සටහන් කරගන්නා මේ නිහතමානී කලාකරුවා පිළිබඳ කතා කරන්නට සන්නසේ ඉඩක් වෙන් කරන්නට අපි සිතුවෙමු. ඔහු විජිත කුමාර යි. මේ විජිත කුමාර සමගින් අප පැවැත්වූ සාකච්ඡාවයි.

## මුහුණට මුහුණ

### ශ්‍රීනාත් මද්දුමගේ

**ඔබේ පාසල් අවදිය ගැන මතක් කරමුද?**
මම අධ්‍යාපනය ලැබුවේ සඳලංකා මධ්‍ය මහා විද්‍යාලයේ. ඒ කාලයේ මම වැඩියෙන්ම කළේ චිත්‍ර ඇඳීම. ස්වභාවික චිත්‍ර සහ ජීවමාන මිනිස් රූප. ඒ හැකියාව දියුණු කර ගන්නට මට මගේ පාසලෙන් විශාල පිටුවහලක් ලැබුණා. ඒ විතරක් නෙවෙයි රුක් කලාව රූප ඇඹීම වගේ දේවල් වලත් මම නිරත වුණා. පාසල් යන කාලයේ මගේ නිර්මාණ වලට පාසල් මට්ටමෙන් හා සමස්ථ ලංකා මට්ටමෙන් සම්මාන සහතික පවා මට ලැබුණා.

මගේ අයියලා දෙන්නා හියුබට් හේමසිරි සහ සිසිර ගාමිණී. මේ දෙන්නා මට වඩා කැමරා ආම්පන්න එක්ක ඔට්ටු වුණා. මේ කාලයේ තවත් මතක් කරන්නම ඕනෙ කෙනෙක් ඉන්නවා. ඔහු තමයි ඡායාරූපකරණය පිළිබඳ අපේ ගුරුවරයා. සරත් කුමාරගේ අයියා. ඔහු වෘත්තියෙන් ගුරුවරයෙක්. මොවුන් කැමරා ආම්පන්න අරගෙන විවිධ පර්යේෂණ කරනවා. ඒ කාලයේ අපට විදුලි ආලෝකය තිබුණෙ නැහැ. අයියලා අපේ වත්ත පල්ලෙහා මඩුවක් හදලා පෙට්‍රෝල් ලාම්පු එළියෙන් කලු සුදු ඡායාරූප මුද්‍රණය කළා. අද කල්පනා කරනකොට මේ සියල්ල හරිම සුන්දර ලෙස දැනෙනවා. මේ විදියට ඡායාරූප මුද්‍රණය කරන්න පුලුවන්ද කියලා අද කෙනෙකුට හිතෙන්නත් පුලුවන්. ඒත් ඔවුන් ඉතා දක්ෂ ලෙස ඒ කටයුත්ත කළා. අයියලා මේවා කරනවා මං බලාගෙන හිටියා. මාත් ඔවුන්ට උදව් කළා. එතනින් තමයි ඡායාරූපකරණයට මගේ හිතේ ආසාවක් ඇති වුණේ.

කැමරාවක් පරිහරණය කරන හැටි මට ඉගැන්නුවේ සරත් කුමාරගේ අයියා.

**ඒ කාලයෙදිම ඡායාරූප ගත්ත ද?**
මට මුලින්ම කැමරාවක් ලැබුණෙ 1981 දී. අපේ ලොකු අයියා විදේශ රටක රැකියාවක් කළා. ඔහු යෂිකා එස්එල්ආර් කැමරාවක් මට දුන්නා. ඒ තමයි මගේ මුල්ම කැමරාව. මම මේ කාලයෙදිම අපොස උසස් පෙළ සමත් වෙලා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයට ඇතුල් වුණා. එහිදීත් මම ඡායාරූප ගත්තා. 1986 දී මම බලන්ගොඩ ඩිපෝවෙ රැකියාවක් ලැබුණා. මේක මට හොඳ අවස්ථාවක් වුණා. මම ගිරිතලේ ඉහළ ගලහ බෙලිහුල්ඔය හැටන් හුන්නස්ගිරිය වැනි සුන්දර ප්‍රදේශ වලට ගිහින් ස්වභාවික ඡායාරූප ගන්න පටන් ගත්තා. පරිසරයෙ හැම දෙයක්ම මම සේයාරූ වලට නැංවුවා. මම කොහොමත් පරිසරයට ආදරය කරන කෙනෙක්. ඒ නිසා ඉතා කලාත්මක ඡායාරූප රැසක් ගන්නට මට හැකි වුණා. මගේ යහලුවන් මේ කාර්යයට මාව දිරිමත් කළා. මම ඒ කාලයේ ගත්ත ඡායාරූප තවමත් ඒ යහලුවන් ගේ ගෙවල් වල තිබෙනවා.

**ඉන් පස්සේ ඔබ ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වෙනවා?**
ඔව්.. 1990 දී මම ඕස්ට්‍රේලියාවට ආවා. 1993 දී මම ට්‍රිප්ල්පේම් නමින් ඡායාරූප ආයතනයක් ආරම්භ කළා. 1994 දි මම විවාහ දිවියට ඇතුල් වුණා. ඇගේ නම තුෂාරි මුණුගොඩ. ඇගෙනුත් මගේ දරුවන්ගෙනුත් මට විශාල සහයෝගයක් ලැබෙනවා මේ කාර්යයන් කරන්නට. ඔවුන්ගේ සහයෝගය නැතිව මේ වගේ දෙයක් ඉදිරියට කරගෙන යන්න අමාරුයි.



**ඔබ කොහොමද වීඩියෝකරණයට යොමු වුණේ?**
මම ඔස්ට්‍රේලියාවෙදි මුලින්ම වීඑච්එස් කැමරාවක් මිලට ගත්තා. මුලින් වීඩියෝ වැඩ කටයුතු කළේ ඒකෙන්. මුල්න්ම මට කරන්න ලැබුණ වීඩියෝ ගත කිරීම තමයි රොක්බෑන්ක් පන්සලේ වැඩසිටි දේවානන්ද හාමුදුරුවන්ගේ ආමික වැඩ සටහනක් වීඩියෝ ගත කිරීම. එතින් පටන් ගතත ගමන තමයි මේ දිග යමින් තිබෙන්නෙ.

**ඔබ ටෙලි නාට්‍ය කැමරාකරණයටත් යොමු වුණා නේද?**
ඔව්. සුමේද රත්නසේකර මහතාගේ සස්වාමික ටෙලි නාට්‍යයේ කැමරාව මෙහෙයවන්න මට ලැබුණා. ඒක විශාල අත්දැකීමක්. ඒ එක්කම නාමල් උඩුගම ග්‍රේෂන් ආනන්ද වැනි ගායකයන්ගේ සහ අප සමග සිටින තවත් ගායක ගායිකාවන් කගේ ගීත සඳහා රූප රචනය කරන්නත් ට අවස්ථාව ලැබුණා.

**ඔබ රූපාවාහිණී වැඩ සටහන් වලටත් සම්බන්ධව සිටියා නේද?**
ඔව්.. චැනල් 31 රූපවාහිණී නාලිකාවේ සිංහල වැඩ සටහනකට මම වසර එකහමාරක් පමණ සම්බන්ධව සිටියා. ඒ දයා සිල්වා මහතාගේ ආරාධනයෙන්.

**ප්‍රසාංගික කලාව ගැන ඔබේ අත්දැකීම් කොහොමද?**
මම ප්‍රසංග විශාල සංඛ්‍යාවක් වීඩියෝ ගත කරලා තියෙනවා. උපාලි කන්නන්ගර ප්‍රියා සූර්යසේන නාමල් උඩුගම කරුණාරත්න දිවුල්ගනේ වැනි ගායක ගයිකාන් රැසකගේ ගීත ප්‍රසංග ාවරණය කළා. ඒහරෙන්නට රිදී රැයක් වැනි ප්‍රසංගත් වීඩියෝ ගත කළා. තරංග දන්දෙනියගේ රාසිං දෙයියෝ ගයාන් කණිෂ්කගේ කොහෙද යන්නෙ හොරෙක් වගේ වැනි නාට්‍යත් මම වීඩියෝ ලත කළා. ළඟදී පැවැත්වුණ සුපර් සික්ස් ප්‍රසංගය වීඩියෝ ගත කළෙත් මම.

ප්‍රසංග වීඩියෝ ගත කිරීම තමයි ඉතාම ආමාරු. මොකද ප්‍රසංගයක යම් තැනක් අතපසු වුණොත් නැවත එය වීඩියෝ ගත කරගන්න ලැබෙන්නෙ නැහැ. ගියොත් ගියාමයි. ඒ නිසා මම ඒ වගේ අවස්ථා වලදි ඉතා වැඩි අවධානයකින් වැඩ කරනවා. මහර වෙලාවට වතුර ටිකක් බොන්නවත් ඉඩක් ලැබෙන්නෙ නැති තරම්. කෙසේ හෝ මට පැවරෙන වගකීම නිසි ලෙස වටහා ගෙන කටයුතු කරන්න මම උත්සාහ කරනවා. මේ වගේ අභියෝග වලට මුහුණ දෙන්න මම කැමතියි.

**ඔබේ පවුලේ විස්තර කොහොමද?**
මගේ පියා සයනේරිස් මව ඇඩ්ලින් සුබසිංහ ඇය මිය ගිහින්. ලොකු අයියා හියුබට් හේමසිරි. දෙවැනි අයියා සිසිර ගාමිණී. ඔහු ගුරුවරයෙක්. රමණී දේවිකා මගේ අක්කා. ඇයත් විද්‍යා ගුරුවරියක්. මේ අය තමයි යහපත් මිනිසකු ලෙස ඉදිරියට යන්නට මග පෙන්නුවේ.

මගේ බිරිඳ තුෂාරි. දරුවන් මිනෝලි නතාෂා සහ මලිත්. මගේ වැඩ කටයුතු වල හොඳ නරක මුලින්ම පෙන්නා දෙන්නෙ මේ අය තමයි. මේ වැඩ කටයු වලට මගේ කාලයෙන් විශාල කොටසක් වැය වෙද්දි මේ අය මට දෙන සහයෝගය මට ලොකු ශක්තියක්.

**වීඩියෝකරණයට අමතරව ඔබ ශබ්ද පරිපාලනය සම්බන්ධයෙනුත් යම් වැඩ කොටසක් කරනවා නේද?**
ඔව්. ප්‍රසංගයකට වශ්‍ය වල සියලුම ශබ්ද විකාශ උපකරණාත් ඩීජේ උපකරණාත් මා ළඟ තියෙනවා. මේ ක්ෂෙත්‍රය ගැනත් මගේ විශාල උනන්දුවක් තියෙනවා.

විජිත කුමාර අප හඳුනන්නේ නිහතමානී කලාකරුවක ලෙසය. රුපියල් සත හඹා යන මිසුන් සිටින ලෝකයක ඔහු සැබැවින්ම අගය කළ යුතු මිනිසෙකි. ගහ කොලට පරිසරයට මිනිසුන්ට ආදරය කරන විජිත වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම හොඳ මිනිසෙකි. හොඳ කලාකරු-වෙක් විය හැක්කේ හොඳ මිනිසෙකුට පමණකි. විජිත එයට උදාහරණයකි.

## චැලෙන්ජස් සිනමාපටයේ ආදායමෙන් ආබාධිත රණවිරු දරුවනට පාසල් උපකරණ

ඊසීසී පදනමේ පළමු ව්‍යපෘතිය වූ චැලෙන්ජස් සිනමා පටය ප්‍රදර්ශනය කිරීමෙන් ලද මුදලින් ආබාධිත රණවිරු පවුල්වල දරුවනට පාසල් උපකරණ සහ මුදල් ආධාර පිරිනෑමීමත් රෝද පුටුවක් පිරිනැමීමත් පසුගියදා කුරුවිට ශ්‍රී ලංකා ගැමුණු හේවා බලකා මූලස්ථානයේදී සිදුවිය. මේ කටයුතු සඳහා සම්බන්ධීකරණ කටයුතු කළේ මේජර් රාජගුරු මහතා ය. මූලස්ථාන නිධාරී කර්නල් බණ්ඩාර සහ අනෙකුත් නිලධාරීන්ගෙන් ලද සහයෝගයද ඉතා විශාල ය.



මේ අවස්ථාවට සහභාගි වූ චිත්‍රපටයේ අධ්‍යක්ෂ උදයකාන්ත වර්ණසූරිය ඊසීසී පදනමේ අනුර කුලසේකර කර්නල් බණ්ඩාර මේජර් රාජගුරු මේජර් දයාවංශ මේජර් කපුරුගේ හා කැප්ටන් කුමාර යන මහත්වරු සේයාරුවේ සිටිති

මේ ව්‍යාපෘතිය සාර්ථක කරගන්නට සහය දුන් ඔස්ට්‍රේලියවේ ශ්‍රී ලාංකික ප්‍රජාවට ඊසීසී පදනමේ ස්තුතිය හිමිවන බව එම පදනමේ අනුර කුලසේකර අසේල ද කොස්තා මහත්වරු සන්නසට දන්වා එවා ඇත .